

තරුෂි විහංසා තෙන්නකෝන්.

5 වසර D

මහාමායා බාලිකා විදුහල මහනුවර

# කෘතියේ අයිතිය

කෘතියේ නම : දඟකාර හා පැංචා

කතෘගේ නම : තරුෂි විහංසා තෙන්නකෝන්

චිත්‍ර : තරුෂි විහංසා තෙන්නකෝන්

**ISBN** : ISBN 978-624-208-014-7

# පිදුම

මෙම කෘතිය එළි දැක්වීමට මා හට

ශක්තිය වූ මහමායා බාලිකා

විදුහලේ විදුහල්පතිතුමිය ඇතුළු

සියලුම ගුරු මහත්ම මහත්මීන්ට හා

මාගෙ පංතිභාර ගුරුතුමියටත්

මෙම කෘතිය

ඉතා ගෞරවයෙන් පුදකර සිටිමි....

## පෙරවදන

වත්මත් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්යෙන් සපිරි පුර වැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනා ගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සාමාජයට ගැලපෙන ලෙස හැඩගැස්විම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන් ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමයා දියනියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යෙමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය ක්ෂේත්‍ර ලේඛක අංකුර දහස්ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන් ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවාට ද ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන් ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි. 2023 සාහිතය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘති එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලේ ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂයාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහපතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්ත මහලේකම්ගේ සේවය අගයමි.

අයෝමි ශෂිකලා සේනාධිර

විදුහල්පති.

මහමායා බාලිකා විදුහල - මහනුවර 2023.11.15

ඔන්න එක කැලෑවක හා පවුලක් ජීවත් වුනා. හා අම්මායි, තාත්තායි, සහ දඟකාර හා පැංචායි. හා තාත්තා කන්තෝරුවක තමයි වැඩ කලේ. හා අම්මා නිවසේ සිටියා.

දඟකාර හා පැංචා දිනපතාම පාසල් ගොස් නිවසට පැමිණි විගසම යාලුවන් සමග කැලෑව ඇතුලට ගොස් සෙල්ලම් කරන්නයි කැමති.

තාත්තා නැති වෙලාවට මේ විදිහට හා පැංචා කැලෑව ඇතුළට ගිහින් සෙල්ලමේ කරනවා ට අම්මා කැමති වුනේ නෑ. හැබැයි හා පැංචා නම් පුරුද්ද අත්හැරියේ නෑ.

දිනපතාම පාසල් ගොස් නිවසට පැමිනි විගසම යාලුවන් සමග කැලෑව ඇතුලට ගොස් සෙල්ලම් කරනවා.

දවසක් මේ විදිහට හා පැංචා මිතුරන් සමග සෙල්ලම් කරමින් ඉන්න කොට විශාල නාගයෙක් එතනට ආවා.

හා පැංචා හා මිතුරන් සියලු දෙනා බොහෝම බය වුනා. සියලු දෙනාම හොඳටම බය වෙලා දුවන්න පටන් ගත්තා.

හා පැංචාත් දිවුවා හා පැංචා දුව ගෙන දුව ගෙන ගිහින් මහන්සියි හොදටම ඒයා වට පිට බැලුවා විශාල ගස් වටෙටම අදුරැයි හැම තැනම කවුරැත් පෙන්න නෑ.

හා පැංචා දුව ගෙන යන කොට එයාට ගෙදරට යන පාර මතක් වුනේ නෑ.

එයා දූවල තියෙන්නේ තව තවත් කැලැව ඇතුලට අනේ හා පැංචා හොදටම බයවෙලා අඩන්න පටන් ගත්තා.

නමුත් කාටවත් ඇහුණේ නැහැ. අනේ හොදටම බය වුනු හා පැංචා ලොකු ගහක මුලක් යටට වේලා හැංගුනා.

බඩගිනියි.මහන්සියි.බයයි. අම්මා නැතිව තනියි. එයාට තමන් කරන වැරැද්ද තේරුනේ දැනුයි. අයනම් අවධානම් තැන් වල සෙල්ලම් කරන්න යන්නේ නෑ අම්මා කියන දේ අහනවා නම් මෙහෙම වෙන්නේ නැහැ එයා තමන්ටම

දොස් කියා ගත්තා. අය මට අම්මා දකින්න ලැබෙයි ද එයාට හිතුනා. එයා හයියෙන් ඇඬුවා.

ඒ අතර හා තාත්තා සවස ගෙදර ආවා ඒයා ගෙදරට එනකොට දැක්කා අම්මා කලබලයෙන් පාර බලන් ඉන්නවා. තාත්තා දැක්ක ගමන් අම්මා තාත්තා ලගට දුවගෙන ගියා. අනේ පුතා තාම ගෙදර ආවේ නැහැ. මම ඒපා කියද්දිම සෙල්ලම් කරන්න ගියා කැලැවට. අම්මා සිද්ධ වෙච්ච දේ කිව්වා.

තාත්තා ඉක්මනින්ම අහල පහල ඉන්න මාමලා කිහිප දෙනෙකුත් එකතු කර ගෙන කැලැවට ගියා. හැම තැනම හා පැංචාව හොයන්න පටන් ගත්තා කට්ටියම. ගොඩක් වේලා ගියාට පසුව හා පැටියා ඉන්න තැනට කට්ටියම කිට්ටු වුනා.

බයේ අඩ අඩ ඉන්න හා පැටියට තාත්තාගේ කටහඬ එකපාරටම ඇහුනා. එයා ඉක්මනින් ගසේ මුල අස්සෙන් එලියට ඇවිල්ලා වටපිට බැලුවා.

අනේ තාත්තා එනවා ගමේ මාමලා කට්ටිය එක්ක එයා එක පිම්මට තාත්තා ලගට දිව්වා.

තාත්තේ මම මෙතන. මට ගෙදරට එන පාර වැරදුනා. අය මම අම්මා තාත්තා කියන දේ අහනවා. අවධානම් තැන්වල සෙල්ලම් කරන්න යන්නේ නැහැ. එයා තාත්තා බදාගෙන කිව්වා.

හරි පුතා අපි දැන් ගෙදර යමු. පුතාට කරපු වැරැද්ද තේරුම් ගියානේ තාත්තා හා පැංචාගේ ඔලුව අතගාමින් කිව්වා.

.....නිමි.....

# පසු වදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුව සිදුවන සමාජ ආර්ථික පරිවර්තනය හේතුකොට ගෙන පොත පතින් දුරුවෙන දරුවන් නැවත පොත පතට සමීප කිරීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඉගෙනීම තුළින් සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමයා පුංචි ගත්කතුවරයින්ටයි. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවත් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන් වෙත ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංක්ෂේප මංකොල්ලකරුවන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ මහාමයා දියණියන් සහ පාසලේ ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරණයට විද්‍යුත් වේදිකාව එක් වුන ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි පතමි.

මෙයට සෙනවිරත්න මහලේකම්ගේ

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කල ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023-11-15